# මාසික වෙළඳ විවරණිකාව

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා මහ බැංකුව

2020 දෙසැම්බර්

02 වෙළුම 12 නිකුතුව

## විශේෂ සිදුවීම්







2020 වසරේ දෙසැම්බර් මාසයේ දී වෙළඳ භාණ්ඩ අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 964ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 3.5කින් පහත වැටුණි.

2020 වසරේ දෙසැම්බර් මාසයේ දී වෙළඳ භාණ්ඩ ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 1,527ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 14.4කින් පහත වැටුණි.







2020 වසරේ දී අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 15.6කින් පහළ ගිය අතර, ආනයන වියදම ද සියයට 19.5කින් පහළ ගියේය.

වෙළඳ හිඟය 2019 වසරේ දෙසැම්බර් මාසයේ දී පැවති එ.ජ. ඩොලර් මිලියන 784ට සාපේක්ෂව 2020 වසරේ දෙසැම්බර් මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 562ක් දක්වා අඩු විය.

## ප්‍රධාන අපනයන හා ආනයන කාණ්ඩ - (2020 ජන. - දෙසැ.)



# අපනයන ක්‍රියාකාරිත්වය

## අපනයන ක්‍රියාකාරිත්වය - (ජන. - දෙසැ.)




සියලු ප්‍රධාන කාණ්ඩවල අපනයන පහළ යෑම හේතුවෙන් 2020 වසරේ දී අපනයන ආදායම පහත වැටුණි.

## අපනයන පරිමා දර්ශකය - (ජන. - දෙසැ.)




සියලු ප්‍රධාන කාණ්ඩවල අපනයන පරිමා පහළ යෑම හේතුවෙන් 2020 වසරේ දී අපනයන පරිමා දර්ශකය පහළ ගියේය.

# කෘෂිකාර්මික අපනයන

## කෘෂිකාර්මික අපනයන ආදායම




## කෘෂිකාර්මික අපනයන පරිමා හා මිල දර්ශක




## කෘෂිකාර්මික අපනයනවල ක්‍රියාකාරිත්වය

## (ජන. - දෙසැ.)




## තේ සහ රබර් මිල ගණන් *




*කොළඹ වෙන්දේසි මිල ගණන් මත පදනම් වන අතර 2020 වසරේ අප්‍රේල් - අගෝස්තු කාලපරිච්ඡේදයේ වෙන්දේසි මිල ගණන් නොමැත.

තේ වෙන්දේසි මිල ගණන් - 2019 | තේ වෙන්දේසි මිල ගණන් - 2020
රබර් වෙන්දේසි මිල ගණන් - 2019 | රබර් වෙන්දේසි මිල ගණන් - 2020

2020 වසරේ දී කෘෂිකාර්මික අපනයන ආදායම පහත වැටුණු අතර තේ, මුහුදු ආහාර, සහ සකස් නොකළ දුම්කොළ අපනයන පහළ යෑම එයට ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ වෙතත්, මෙම කාලපරිච්ඡේදය තුළ දී සුළු කාෂිකාර්මික නිෂ්පාදිත, කුළුබඩු සහ පොල් අපනයන ආදායම ඉහළ ගියේය.

# කාර්මික අපනයන

### කාර්මික අපනයන ආදායම




### කාර්මික අපනයන පරිමා හා මිල දර්ශක




### කාර්මික අපනයනවල ක්‍රියාකාරිත්වය (ජන. - දෙසැ.)




### නැව් හා ගුවන් යානා ඉන්ධනවල අපනයන මිල ගණන්




2020 වසරේ දී කාර්මික අපනයන ආදායම සැලකිය යුතු ලෙස පහත වැටුණු අතර, රෙදිපිළි හා ඇඟලුම්, ඛනිජ තෙල් නිෂ්පාදිත, මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ, රබර් නිෂ්පාදිත, ප්‍රවාහන උපකරණ සහ මූල ලෝහ අපනයන ආදායම පහළ යෑම එයට හේතු විය.

# ආනයන ක්‍රියාකාරිත්වය

### ආනයන ක්‍රියාකාරිත්වය - (ජන. - දෙසැ.)




### ආනයන පරිමා දර්ශකය (ජන. - දෙසැ.)




2020 වසරේ දී ආනයන වියදම පහත වැටුණු අතර, සියලුම ප්‍රධාන කාණ්ඩවල ආනයන පහත වැටීම එයට හේතු විය. මේ අතර, සියලුම ප්‍රධාන කාණ්ඩවල ආනයන පරිමා පහළ යෑම හේතුවෙන් සලකා බලන කාලපරිච්ඡේදය තුළදී ආනයන පරිමා දර්ශකය පහළ ගියේය.

# පාරිභෝගික භාණ්ඩ ආනයන

### පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම




### පාරිභෝගික භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක




### පාරිභෝගික භාණ්ඩ ආනයනවල ක්‍රියාකාරිත්වය (ජන. - දෙසැ.)




### සීනි, පරිප්පු සහ කිරිපිටි සඳහා වූ සාමාන්‍ය ආනයන මිල ගණන්




2020 වසරේ දී පෞද්ගලික රථවාහන, රෙදිපිළි හා උපාංග, ගෘහ හා දැව භාණ්ඩ සහ රබර් නිෂ්පාදිත ඇතුළු ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන පහළ යෑම හේතුවෙන් පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව පහළ ගියේය. ආහාර හා පාන වර්ග උප කාණ්ඩය යටතේ වර්ග කර ඇති පාන වර්ග, මුහුදු ආහාර, පලතුරු සහ සහල් ආනයන වියදම ද පහළ ගියේය.

# අන්තර් භාණ්ඩ ආනයන

### අන්තර් භාණ්ඩ ආනයන වියදම




### අන්තර් භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක



අන්තර් භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය
(ජන. - දෙසැ.)




බොර තෙල් හා පොහොර ආනයන මිල ගණන් (මාසික සාමාන්‍ය අගයන්)




ප්‍රධාන වශයෙන් ඉන්ධන, රෙදිපිළි හා රෙදිපිළි උපාංග, මූල ලෝහ සහ ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත ආනයන පහළ යෑම හේතුවෙන් 2020 වසරේ දී අන්තර් භාණ්ඩ ආනයන වියදම පහළ ගියේය. කෙසේ වුවද, මෙම කාලපරිච්ඡේදය තුළදී පොහොර, තිරිඟු හා ඉරිඟු, ආහාර සැකසුම් සහ කෘෂිකාර්මික යෙදවුම් ආනයන වියදම ඉහළ ගියේය.

## ආයෝජන භාණ්ඩ ආනයනය

ආයෝජන භාණ්ඩ ආනයන වියදම




ආයෝජන භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක




ආයෝජන භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය
(ජන. - දෙසැ.)




සියලු ප්‍රධාන කාණ්ඩවල ආනයන පහත වැටීම හේතුවෙන් 2020 වසරේ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම පහළ ගියේය.

# විදේශීය වෙළඳාම - සාරාංශය

## අපනයන ක්‍රියාකාරිත්වය (එ.ජ. ඩොලර් මිලියන)

| | | දෙසැ. - 19 | දෙසැ - 20 | වෙනස (%) | ජන. -දෙසැ 2019 | ජන. - දෙසැ. 2020 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **කෘෂිකාර්මික අපනයන** | | **195.4** | **203.3** | **4.1** | **2,461.9** | **2,336.2** | **-5.1** |
| එයින් | තේ | 105.8 | 113.0 | 6.8 | 1,346.4 | 1,240.9 | -7.8 |
| | පොල් | 21.8 | 26.8 | 22.6 | 329.5 | 345.2 | 4.8 |
| | කුළුබඩු | 21.1 | 33.1 | 56.8 | 312.5 | 333.5 | 6.7 |
| | මුහුදු ආහාර | 23.9 | 14.4 | -39.7 | 262.5 | 189.8 | -27.7 |
| **කාර්මික අපනයන** | | **798.9** | **755.5** | **-5.4** | **9,426.3** | **7,701.7** | **-18.3** |
| එයින් | රෙදිපිළි හා ඇඟලුම් | 483.2 | 451.8 | -6.5 | 5,596.5 | 4,423.1 | -21.0 |
| | රබර් නිෂ්පාදිත | 73.0 | 74.9 | 2.6 | 866.1 | 786.1 | -9.2 |
| | ඛනිජතෙල් නිෂ්පාදිත | 55.3 | 31.2 | -43.6 | 521.1 | 373.6 | -28.3 |
| | ආහාර, පාන වර්ග හා දුම්කොළ | 36.1 | 41.4 | 14.5 | 447.0 | 464.0 | 3.8 |
| | යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 29.7 | 39.6 | 33.4 | 400.0 | 337.5 | -15.6 |
| | මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 24.3 | 18.7 | -22.9 | 305.7 | 211.2 | -30.9 |
| | සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 7.5 | 4.4 | -40.8 | 102.9 | 53.9 | -47.6 |
| **ඛනිජ හා වෙනත් අපනයන** | | **5.7** | **5.6** | **-0.7** | **51.8** | **39.2** | **-24.4** |
| **මුළු අපනයන** | | **999.9** | **964.5** | **-3.5** | **11,940.0** | **10,077.1** | **-15.6** |

## ආනයන ක්‍රියාකාරිත්වය (එ.ජ. ඩොලර් මිලියන)

| කාණ්ඩය | | දෙසැ. - 19 | දෙසැ - 20 | වෙනස (%) | ජන. -දෙසැ 2019 | ජන. - දෙසැ. 2020 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **පාරිභෝගික භාණ්ඩ** | | **390.9** | **327.7** | **-16.2** | **3,956.5** | **3,401.7** | **-14.0** |
| ආහාර හා පාන වර්ග | | 148.0 | 158.1 | 6.8 | 1,426.9 | 1,554.4 | 8.9 |
| එයින් | එළවළු (අ) | 40.5 | 39.6 | -2.3 | 310.0 | 352.9 | 13.8 |
| වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | | 242.8 | 169.7 | -30.1 | 2,529.6 | 1,847.3 | -27.0 |
| එයින් | පෞද්ගලික රථවාහන | 83.9 | 0.5 | -99.5 | 815.7 | 282.9 | -65.3 |
| **අන්තර් භාණ්ඩ** | | **956.4** | **865.0** | **-9.6** | **11,369.6** | **9,076.5** | **-20.2** |
| එයින් | ඉන්ධන | 333.2 | 235.1 | -29.5 | 3,891.6 | 2,542.6 | -34.7 |
| | රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 248.3 | 234.8 | -5.4 | 2,909.4 | 2,335.1 | -19.7 |
| | පොහොර | 17.4 | 30.4 | 75.0 | 221.4 | 258.9 | 16.9 |
| | තිරිඟු හා ඉරිඟු | 20.1 | 41.9 | 108.9 | 346.4 | 384.4 | 11.0 |
| **ආයෝජන භාණ්ඩ හා වෙනත්** | | **436.9** | **333.9** | **-23.6** | **4,610.9** | **3,577.2** | **-22.4** |
| එයින් | යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 238.5 | 211.2 | -11.5 | 2,489.7 | 2,176.1 | -12.6 |
| **මුළු ආනයන** | | **1,784.2** | **1,526.6** | **-14.4** | **19,937.1** | **16,055.4** | **-19.5** |

## වෙළඳ ශේෂය (එ.ජ. ඩොලර් මිලියන)

| කාණ්ඩය | දෙසැ. - 19 | දෙසැ - 20 | වෙනස (%) | ජන. -දෙසැ 2019 | ජන. - දෙසැ. 2020 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **වෙළඳ ශේෂය** | -784.2 | -562.2 | | -7,997.1 | -5,978.3 | |

## වෙළඳ දර්ශක හා වෙළඳ මිල අනුපාතය (2010 = 100) (ආ)

| කාණ්ඩය | | දෙසැ. - 19 | දෙසැ - 20 | වෙනස (%) | ජන. -දෙසැ 2019 | ජන. - දෙසැ. 2020 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **අපනයන** | | | | | | | |
| | වටිනාකම් දර්ශකය | 139.2 | 134.2 | -3.5 | 138.5 | 116.9 | -15.6 |
| | පරිමා දර්ශකය | 178.9 | 168.1 | -6.0 | 147.2 | 133.1 | -9.6 |
| | මිල දර්ශකය | 77.8 | 79.9 | 2.7 | 94.1 | 87.8 | -6.7 |
| **ආනයන** | | | | | | | |
| | වටිනාකම් දර්ශකය | 159.7 | 136.6 | -14.4 | 148.7 | 119.7 | -19.5 |
| | පරිමා දර්ශකය | 182.4 | 156.9 | -14.0 | 164.2 | 145.5 | -11.4 |
| | මිල දර්ශකය | 87.6 | 87.1 | -0.5 | 90.5 | 82.3 | -9.1 |
| **වෙළඳ මිල අනුපාතය** | | 88.8 | 91.7 | 3.2 | 103.9 | 106.7 | 2.7 |

(අ) පරිප්පු, ඇණු,අර්තාපල්, රනිල කුලයට අයත් එළවළු සහ වෙනත් එළවළු ඇතුළත් වේ.
(ආ) එ.ජ. ඩොලර්වලින් ගණනය කරන ලද